I

01. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් නිසා ඇති වූ බලපෑම ගිණුම්කරණ සමීකරණය තුළින් පහත පරිදි නිරූපණය වේ.

| වත්කම් | = | වගකීම් | + | හිමිකම |
|---|---|---|---|---|
| - 45 000 | | - 50 000 | | + 5 000 |

මෙහිදී නිරූපණය වන ගනුදෙනුව වන්නේ

(1) පිරිවැය රු.45 000ක් වූ භාණ්ඩ රු. 50 000කට ණයට විකිණීම යි.
(2) රු.5 000ක පොලියක් සමග බැංකු ණය රු. 50 000 ක් ගෙවීම යි.
(3) ණයහිමියෙකුට ගෙවිය යුතු රු.50 000ක් පියවීම සඳහා රු. 45 000ක් ගෙවීම යි.
(4) රු.50 000ක භාණ්ඩ 10%ක එකතු කළ අගය මත බදු (VAT) සහිතව ණයට මිලදී ගැනීම යි.
(5) ධාරණ වටිනාකම රු.45 000ක යන්ත්‍රයක් රු. 50 000කට ණයට විකිණීම යි.

(........)

02. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 75 000 ක අලාභයක් ලැබූ ව්‍යාපාරයකට අදාළව පහත සඳහන් තොරතුරු සපයා ඇත. මෙම ව්‍යාපාරය 2013.04.01 දින ආරම්භ කරන ලදී.

| | රු. '000 |
|---|---|
| වර්ෂය තුළ මුළු වගකීම්වල වැඩිවීම | 900 |
| ගැනිලි | 50 |
| අතිරේක ප්‍රාග්ධනය යෙදවීම | 225 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ වත්කම්වල **වැඩිවීම** හෝ **අඩුවීම** කොපමණ ද ?

(1) රු.825 000 ක වැඩිවීම කි.
(2) රු. 975 000 ක අඩුවීම කි.
(3) රු.975 000 ක වැඩිවීම කි.
(4) රු.1 000 000 ක වැඩිවීම කි.
(5) රු.1 150 000 ක වැඩිවීම කි.

(........)

03. ගොඩනැගිලි නඩත්තු කිරීම්, වර්ෂය සඳහා ආදායම් බදු, ගැනිලි, අඩමාන ණය සඳහා වෙන් කිරීම යන ගිණුම් අනුපිළිවෙළින් වර්ග කරනුයේ, පහත සඳහන් කුමන ආකාරයට ද?

(1) වියදම්, වියදම්, හිමිකම්, වත්කම්
(2) වියදම්, වගකීම්, වියදම්, ආදායම්
(3) වියදම්, ආදායම්, හිමිකම්, වත්කම්
(4) වත්කම්, වත්කම්, හිමිකම්, වගකීම්
(5) වත්කම්, ආදායම්, හිමිකම්, වත්කම්

(........)

04. ජනවාරි මාසය තුළදී ආයතනයක් රු. 100 000 ක් වටිනා භාණ්ඩ ගැනුම්කරුවෙකුට ඉන්වොයිස් කර ඇත. නමුත් ගැනුම්කරු වෙත යවා ඇත්තේ රු. 90 000 ක් වටිනා භාණ්ඩ පමණක් බව පසුව අනාවරණය විය. මෙම වෙනස ආයතනයේ පොත්වල සටහන් කිරීමට අදාළ ජර්නල් සටහන වන්නේ:

| | **හර** | **බැර** |
|---|---|---|
| (1) | ආපසු එවුම් ගිණුම | ණයගැති ගිණුම |
| (2) | ණයහිමි ගිණුම | ආපසු යැවුම් ගිණුම |
| (3) | විකුණුම් ගිණුම | ආපසු යැවුම් ගිණුම |
| (4) | ණයහිමි ගිණුම | ගැනුම් ගිණුම |
| (5) | විකුණුම් ගිණුම | ණයගැති ගිණුම |

(........)

05. පහත කුමන ප්‍රකාශය සුළු මුදල් අග්‍රිම ක්‍රමය සම්බන්ධයෙන් **නිවැරදිවේ ද?**

(1) සුළු මුදල් ගෙවීම් පිළිබඳ මූලාශ්‍ර ලියවිල්ලක් ලෙස හරපත භාවිත කෙරේ.
(2) සුළු මුදල් අග්‍රිම ක්‍රමය මුදල් පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය.
(3) සෑම අග්‍රිම කාලයක් අවසානයේදී ම එක සමාන මුදල් ප්‍රමාණයක් සුළු මුදල් ගෙවීම වෙනුවෙන් ප්‍රතිපූරණය කෙරේ.
(4) සෑම අග්‍රිම කාලයක් අවසානයේදී සුළු මුදල් භාරකරු සතුව ඇති මුදලට සමාන වටිනාකමක් ප්‍රතිපූරණය කෙරේ.
(5) අග්‍රිම කාලය අවසානයේදී සුළු මුදල් භාරකරු සතුව ඇති මුදලෙහි සහ එම කාලය තුළ වැය කර ඇති මුදලෙහි එකතුව අග්‍රිම මුදලට සමාන වේ.

(........)

06. ව්‍යාපාරයක සේවකයින්ගේ මාසික දළ වේතනය රු. 400 000ක් වූ අතර, සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිළිවෙළින් රු. 60 000 ක් හා රු. 40 000 ක් විය. වේතන මුදලින් ගෙවා ඇතිමුත් සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගෙවනු ලබන්නේ ඉදිරි මාසයේදී ය. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ පහත සඳහන් කුමන ආකාරයට ද?

| | වත්කම් (රු.) | = | වගකීම් (රු.) | + | හිමිකම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | - 360 000 | = | + 40 000 | | - 400 000 |
| (2) | - 360 000 | = | + 60 000 | | - 420 000 |
| (3) | - 360 000 | = | + 100 000 | | - 460 000 |
| (4) | - 400 000 | = | + 100 000 | | - 500 000 |
| (5) | - 460 000 | = | + 40 000 | | - 500 000 |

07. පහත සඳහන් කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදිවේ ද?**
A - අඛණ්ඩ පැවැත්මක් නොමැති ව්‍යාපාරවල සියලු වත්කම් ජංගම වත්කම් ලෙස සැලකේ.
B - ආරක්ෂණ සංකල්පයට අනුව ඉඩමක වෙළෙඳපළ වටිනාකම වැඩිවීම ගිණුම්ගත කළ යුතු වේ.
C - සංගතතා සංකල්පයට අනුව, ව්‍යාපාරයක් තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කළ යුතු වේ.
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි. (........)

08. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සංකල්පීය රාමුවට අනුව පහත සඳහන් කුමන නිර්ණායක ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් හඳුනා ගැනීමේ දී සපුරාලිය යුතු ද?
A - එම අයිතමය වගකීමක නිර්වචනයට අනුකූල වීම.
B - අයිතමය හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයකින් පිටතට ගලා යෑමේ හැකියාවක් තිබීම.
C - විශ්වාසවන්ත ලෙස මැනිය හැකි පිරිවැයක් හෝ වටිනාකමක් අයිතමයට තිබීම.
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම. (........)

09. ව්‍යාපාරයක 2013.03.31 දිනට අවසාන තොගය රු. 30 000ක් වැඩියෙන් ද, 2014.03.31 දිනට අවසාන තොගය රු. 10 000ක් අඩුවෙන් ද, ගණනය කර ඇත. මෙමගින් මෙම වර්ෂ දෙකෙහි ලාභයට ඇතිවන බලපෑම කොපමණ ද?

| | 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය | 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය |
|---|---|---|
| (1) | රු. 30 000කින් වැඩි වේ. | රු. 10 000කින් අඩු වේ. |
| (2) | රු. 30 000කින් අඩු වේ. | රු. 10 000කින් වැඩි වේ. |
| (3) | රු. 30 000කින් වැඩි වේ. | රු. 20 000කින් අඩු වේ. |
| (4) | රු. 30 000කින් වැඩි වේ. | රු. 40 000කින් අඩු වේ. |
| (5) | රු. 30 000කින් අඩු වේ. | රු. 40 000කින් වැඩි වේ. |

(........)

10. ව්‍යාපාරයක් 2014.03.31 දිනට රු. 70 000ක ධාරණ වටිනාකමක් සහිත උපකරණයක් හුවමාරු කරමින්, රු. 100 000ක් වටිනා නව උපකරණයක් එදින ලබා ගන්නා ලදී. මෙම ගනුදෙනුව සඳහා පැරණි උපකරණය සමඟ මුදලින් රු. 40 000ක් ගෙවන ලදී. උපකරණ හුවමාරු කිරීමේ දී ලාභය හෝ අලාභය කොපමණ ද?
(1) ලාභය රු. 10 000 (2) අලාභය රු. 10 000 (3) ලාභය රු. 30 000
(4) අලාභය රු. 30 000 (5) අලාභය රු. 50 000 (........)

11. "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 දේපළ පිරියත සහ උපකරණ" හි ඇතුළත් නිර්වචන කිහිපයක් පහත දැක්වේ.
A - වත්කමේ වටිනාකමෙන් එහි සමුච්චිත ක්ෂය අඩුකළ පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වනු ලබන වටිනාකම.
B - දැනුම සහ කැමැත්ත සහිත පාර්ශවයන් අතර අතේ දුරින් සිදුවන ගනුදෙනුවක දී වත්කමක් හුවමාරුවන වටිනාකම.
C - වත්කමක පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් එහි සුන්බුන් අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම.
ඉහත නිර්වචන අතරින් වත්කමක සාධාරණ අගය, ධාරණ වටිනාකම හා ක්ෂය කළ හැකි වටිනාකම යන්න පිළිවෙළින් දක්වනුයේ:
(1) A, B හා C (2) A, C හා B (3) B, A හා C (4) B, C හා A (5) C, A හා B (........)

**• ප්‍රශ්න අංක 12, 13 සහ 14 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

පහත සඳහන් තොරතුරු 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පසිඳු, දිලීප සහ රුක්ෂාන් හවුල්ව්‍යාපාරයට අදාළ වේ.
A - දිලීපගේ වේතනය වාර්ෂිකව රු. 24 000කි.
B - ඉහත වේතනවලින් රු. 12 000ක් වර්ෂය තුළදී ගෙවා ඇත.
C - පසිඳු, දිලීප හා රුක්ෂාන් අතර බෙදා ගත් ලාභ කොටස් පිළිවෙළින් රු. 40 000 ක් රු. 30 000 ක් හා රු. 20 000 ක් වේ.
D - රුක්ෂාන්ට ගෙවිය යුතු ණය පොළී රු. 3 000ක් පිළිබඳ ව සටහන් තබා නැත.
E - පසිඳු හා රුක්ෂාන්ගේ භාණ්ඩ ගැනිලි පිළිවෙළින් රු. 3 000 ක් හා රු. 2 000 ක් වූ අතර, ඒ සම්බන්ධව පොත්වල සටහන් තබා නැත.

12. ඉහත කුමන අයිතම හවුල්කරුවන්ට කරනු ලබන ලාභාලාභ විසර්ජන ලෙස සැලකේ ද?
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B, C හා D පමණි. (5) A, B, C, D හා E යන සියල්ලම. (........)

13. 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය:
(1) රු. 90 000 කි. (2) රු. 102 000 කි. (3) රු. 106 000 කි.
(4) රු. 114 000 කි. (5) රු. 116 000 කි. (........)

14. ඉහත දී ඇති සියලු තොරතුරු සැලකිල්ලට ගත් පසු, 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ, හවුල් ව්‍යාපාරයේ හිමිකමේ වැඩිවීම වන්නේ:
(1) රු. 94 000 (2) රු. 97 000 (3) රු.100 000 (4) රු. 104 000 (5) රු. 116 000 (........)

15. ව්‍යාපාර ආයතනයක් එක්තරා ගිණුම් වර්ෂයක් තුළ දී රු. 20 000ක ඇසුරුම් ද්‍රව්‍ය මිලට ගෙන ඇත. මෙයින් රු. 4 000ක ඇසුරුම් ද්‍රව්‍ය වර්ෂය තුළ හානියට පත් වූ අතර, රු. 9 000ක තොගයක් ප්‍රයෝජනයට ගෙන ඇත. ඉහත සිදුවීම් හේතුවෙන් එම ගිණුම් වර්ෂයේ වියදමෙහි වැඩි වීම වන්නේ:
(1) රු. 4 000 (2) රු. 7 000 (3) රු. 9 000 (4) රු. 13 000 (5) රු. 20 000 (........)

13 ශ්‍රේණිය
ගිණුම්කරණය I

● ප්‍රශ්න අංක 16 සහ 17 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින ලක්නාත් සමාගමට පහත ගනුදෙනු අදාළ වේ.

A - ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රයක් අත්පිට මුදලට මිලදී ගැනීම.
B - තුන්මසකින් කල් පිරෙන රු. 50 000ක භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම.
C - මූල්‍ය කල්බදු යටතේ මිලදී ගත් මෝටර්රථය සඳහා වාරිකය ගෙවීම.
D - රු. 50 බැගින් වූ ප්‍රතිෂ්ඨාවක් සහිතව සාමාන්‍ය කොටස් 10 000ක් දැනට සිටින කොටස්කරුවන්ට සංචිත භාවිතයෙන් නිකුත් කිරීම.

16. ඉහත සඳහන් කුමන ගනුදෙනු තුළින් මුදල් වැඩි අඩු වේද?
(1) A හා B පමණි (2) A හා C පමණි (3) A, B හා C පමණි (4) B හා D පමණි (5) B, C හා D පමණි

17. ඉහත කුමන ගනුදෙනු වලින් දිගු කාලීන ණය වෙනස් වීම් වලට අදාළව මුදල් ගෙවීමක් ඇති වේද?
(1) B පමණි (2) C පමණි (3) B හා C පමණි (4) B හා D පමණි (5) C හා D පමණි

18. පහත සඳහන් තොරතුරු රවිඳුගේ ව්‍යාපාරයට අදාළ වේ.

| | 2014.03.31 | 2013.03.31 |
|---|---|---|
| තොගය | 300 000 | 200 000 |
| ණයගැතියෝ | 180 000 | 140 000 |

2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ණයගැතියන්ගෙන් රු. 920 000 ක් ලැබුණු අතර, අත්පිට විකුණුම් රු. 790 000 ක් විය.
ව්‍යාපාරය පිරිවැය මත 40% ක ලාභ ප්‍රතිශතයක් සහිතව විකුණුම් සිදු කරයි. ව්‍යාපාරයේ 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගැනුම් කොපමණ ද?
(1) රු. 1 134 000 (2) රු. 1 150 000 (3) රු. 1 350 000 (4) රු. 1 550 000 (5) රු. 1 564 000 (........)

● ප්‍රශ්න අංක 19, 20 සහ 21 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

පහත සඳහන් තොරතුරු සීමිත දුෂ්මන්ත සමාගමට අදාළ වේ.

| | 2014.03.31 (රු. '000) | 2013.03.31 (රු. '000) |
|---|---|---|
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| කොටසක් රු. 200/- බැගින් වූ සාමාන්‍ය කොටස් | 13 000 | 13 000 |
| කොටසක් රු. 5/- බැගින් ලාභාංශ හිමි නිදහස් කළ නොහැකි වරණීය කොටස් 200 000 | 4 000 | 4 000 |
| **සංචිත** | | |
| පොදු සංචිතය | 3 400 | 3 000 |
| රඳවාගත් ඉපැයුම් | 3 600 | 2 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 15% දිගු කාලීන ණය | 2 000 | 2 000 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු ආදායම් බදු | 100 | 80 |
| ණය හිමියෝ | 140 | 150 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 280 000 කි.

19. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පෙර ලාභය:
(1) රු. 1 600 000 (2) රු. 2 400 000 (3) රු. 2 700 000
(4) රු. 3 000 000 (5) රු. 3 300 000 (........)

20. 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හිමිකම
(1) 20 000 (2) 24 000 (3) 13 000 (4) 7 000 (5) 17 000

21. 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හිමිකමේ වැඩි වීම,
(1) 2 000 (2) 1 000 (3) 1 970 (4) 1 700 (5) වැඩි විය හැක

● ප්‍රශ්න අංක 22 සහ 23 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.

නැණස පුස්තකාල සංගමයේ 2013.03.31 දිනට යාවජීව සාමාජික මුදල් ගිණුමේ ශේෂය රු. 150 000කි. ඉන් 10%ක ප්‍රමාණයක් වාර්ෂිකව සාමාජික මුදල් ආදායමට එකතු කරයි. වාර්ෂික සාමාජික මුදල රු. 500 ක් වන අතර, 2014.03.31 දිනට යාවජීව සාමාජිකයන් හැර සාමාජික සංඛ්‍යාව 200කි. 2013.03.31 දිනට සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන් 20ක් ද ඉදිරි වර්ෂයට සාමාජික මුදල් ගෙවූ සාමාජිකයන් 25ක් ද විය. 2014.03.31 දිනට සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන් 30ක් ද ඉදිරි වර්ෂයට ද සාමාජික මුදල් ගෙවූ සාමාජිකයන් 20ක් ද විය.

22. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හඳුනාගත් සාමාජික මුදල් ආදායම:
(1) රු. 67 500 (2) රු. 90 000 (3) රු. 102 500 (4) රු. 115 000 (5) රු. 150 000 (........)

23. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ලද සාමාජික ගාස්තු:
(1) රු. 52 500 (2) රු. 75 000 (3) රු. 87 500 (4) රු. 92 500 (5) රු. 100 000 (........)

24. පහත සඳහන් ඒවායින් බැංකු ශේෂ සංසන්දනය කිරීමක් තුළින් හඳුනාගත නොහැකි වන්නේ කුමක් ද?
(1) රු. 1 000ක හර බද්ද මුදල් පොතේ මෙතෙක් වාර්තා නොකිරීම
(2) ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු. 2 000ක චෙක්පත මුදල් පොතේ රු. 2200 ලෙස වාර්තා කිරීම
(3) රු. 3 333ක උපලබ්ධි වූ චෙක්පතක් මුදල් පොතේ රු. 333ක් ලෙස සටහන් කිරීම
(4) බැංකුව විසින් ස්ථාවර නියෝග මත කළ ගෙවීමක් මුදල් පොතේ සටහන් නොවීම
(5) ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ රු. 2500ක චෙක්පතක් මුදල් පොතේ රු. 2550ක් ලෙස වාර්තා කිරීම (...........)

25. ජංගම වත්කම් ලෙස සැලකෙනුයේ උපලබ්ධිවීම, විකිණීම හෝ පරිභෝජනය
(1) එක් මූල්‍ය වර්ෂයක් තුළ දී සිදු වෙතැයි අපේක්ෂිත වත්කම ය.
(2) මෙහෙයුම් චක්‍රය තුළ දී සිදු වෙතැයි අපේක්ෂිත වත්කම ය.
(3) මෙහෙයුම් චක්‍රය හා මූල්‍ය වර්ෂයක් යන දෙකෙන් වඩා අඩු කාලය තුළ දී සිදු වෙතැයි අපේක්ෂිත වත්කම ය.
(4) මෙහෙයුම් චක්‍රය හා මූල්‍ය වර්ෂයක් යන දෙකෙන් වඩා වැඩි කාලය තුළ දී සිදු වෙතැයි අපේක්ෂිත වත්කම ය.
(5) ව්‍යාපාරය අඛණ්ඩව පවතී යැයි සිතන කාලය තුළ දී සිදු වෙතැයි අපේක්ෂිත වත්කම ය. (...........)

26. ව්‍යාපාරයකට අදාළ ව පහත තොරතුරු සපයා ඇත.

| | 2010.03.31 දිනට | 2009.04.01 දිනට |
|---|---|---|
| ණයහිමියෝ | රු. 32 500 | රු. 26 250 |
| බඩු තොගය | රු. 20 000 | රු. 22 500 |

වර්ෂය තුළ ණයහිමියන්ට ගෙවූ මුදල රු. 112 500 කි. මෙම ව්‍යාපාරය විකුණුම් මිල නියම කරන්නේ සැම විටම විකුණුම් පිරිවැයට 20% ක ලාභ ආන්තිකයක් එකතු කිරීමෙනි. ඉහත තොරතුරුවලට අනුව 2009/2010 වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු විකුණුම් වටිනාකම වන්නේ
(1) රු. 124 500 කි.
(2) රු. 130 500 කි.
(3) රු. 135 625 කි.
(4) රු. 139 500 කි.
(5) රු. 145 500 කි. (...........)

27. 2009/2010 වර්ෂය තුළ දී ව්‍යාපාරයක් විසින් මුදලින් ගෙවා ඇති රක්ෂණ වාරිකවල එකතුව වූ රු. 25 000 පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කර ඇත.

| රක්ෂණ වර්ගය | ගෙවූ වාරික මුදල (රු.) | ආවරණය වන කාලපරිච්ඡේදය |
|---|---|---|
| ගිනි රක්ෂණය | 3 000 | 2010.07.30 න් අවසන් වර්ෂය |
| සාමාන්‍ය රක්ෂණය | 18 000 | 2009.04.01 - 2009.11.30 දක්වා කාලය |
| වගකීම් රක්ෂණය | 4 000 | 2010.03.31න් අවසන් වර්ෂය |

ඉහත තොරතුරු මත 2010.03.31න් අවසන් වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුත්තේ
(1) රු. 16 800 කි.
(2) රු. 17 800 කි.
(3) රු. 24 000 කි.
(4) රු. 25 000 කි.
(5) රු. 33 200 කි. (...........)

28. ගිණුම් වර්ෂයක් අවසානයේ නිෂ්පාදන ව්‍යාපාරයක් සතුව තිබූ නිෂ්පාදනයට යොදාගන්නා ද්‍රව්‍ය කාණ්ඩ 3 ක් සම්බන්ධව තොරතුරු පහත දී ඇත.

| තොග කාණ්ඩය | ඒකකයක පිරිවැය රු. | ඒකක ගණන | ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල රු. | ඒකකයක විකුණුම් ඇස්තමේන්තුගත වියදම් රු. (ඒකකයකට) |
|---|---|---|---|---|
| A | 15 | 10 000 | 12 | 2 |
| B | 8 | 5 000 | 12 | 2 |
| C | 20 | 5 000 | 15 | 3 |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ඉහත තොගයේ වටිනාකම වන්නේ
(1) රු. 200 000 කි.
(2) රු. 235 000 කි.
(3) රු. 255 000 කි.
(4) රු. 290 000 කි.
(5) රු. 300 000 කි. (...........)

29. අජිත සහ තුෂාරගේ හවුල් ව්‍යාපාරයේ 2010.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභ විසර්ජනය පහත පරිදි සිදුකර ඇත.

| | අජිත (රු.) | තුෂාර (රු.) |
|---|---|---|
| හවුල් වේතන | 36 000 | - |
| ප්‍රාග්ධන පොලී | 30 000 | 20 000 |
| ලාභ කොටස් | 30 000 | 30 000 |
| ගැනිලි පොලී | 3 000 | 2 000 |

2010.03.31 දින තුෂාර ලබාගත් රු. 6 000ක භාණ්ඩ පිළිබඳ ව ගිණුම්වල සටහන් තබා නැති බව පසුව හෙළිදරව් විය. 2010.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය

(1) රු. 135 000 කි.
(2) රු. 140 000 කි.
(3) රු. 141 000 කි.
(4) රු. 146 000 කි.
(5) රු. 147 000 කි.

(............)

30. එක්තරා සමාගමක 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010.06.30 දින අනුමත කර ඇත. පහත ගනුදෙනු 2010.03.31 සහ 2010.06.30 දින අතර සිදුවී ඇත.
මෙම ගනුදෙනු අතුරෙන් 2010.03.31 දිනට ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ගළපන සිදුවීම කුමක් ද?

(1) අධ්‍යක්ෂවරුන් සාමාන්‍ය කොටස් සඳහා 10%ක ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම
(2) 2010.03.31 දිනට වූ රු. 75 000 ක ණයගැතියකු 2010.04.20 දින බුන්වත් වී ඇති බවට තහවුරු වීම
(3) 2010.05.01 දින ව්‍යාපාරයෙහි වෙළෙඳපොළ ආයෝජනයන්ගේ මිල රු. 20 000 කින් පහත වැටීම
(4) 2010.05.22 දින ඇති වූ ගින්නකින් ගබඩාවේ තිබූ තොගයෙන් රු. 40 000 ක් වටිනා තොග විනාශ වීම
(5) 2010.06.16 දින රු. 75 000 ක් වටිනා වත්කම් විනාශවී තිබීම

(...

31. අදාළ තීරුවේ පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව "√" ලකුණකින් දක්වන්න.

| | | **සත්‍ය** | **අසත්‍ය** |
|---|---|---|---|
| A - | ගිණුම්කරණයේ මූලික අරමුණ ආයතනයක ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් එහි කළමනාකරුවන්ට සැපයීමය. | ............ | ............ |
| B - | ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවන සියලු වැරදි ශේෂ පිරික්සුම තුළින් අනාවරණය කර ගත හැක. | ............ | ............ |
| C - | මූල්‍ය මිනුම් සංකල්පයට අනුව මුදලේ වටිනාකම ස්ථාවරව පවතී යයි උපකල්පනය කරයි. | ............ | ............ |
| D - | භාණ්ඩයක් මිලට ගැනීමේ දී ලකුණු කළ මිලෙන් අඩු කරනු ලබන වෙළඳ වට්ටම, ලද වට්ටම් ගිණුමට බැර කරයි. | ............ | ............ |

32. වෙළෙඳ ව්‍යාපාරයක පහත සඳහන් ගනුදෙනුවලට අදාළ වන මූලික සටහන් පොත සහ ප්‍රභව ලියවිල්ල සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික පොත** | **ප්‍රභව ලියවිල්ල** |
|---|---|---|
| (1) නැවත විකිණීම සඳහා ණයට භාණ්ඩ මිලදී ගැනීම | ................................ | ................................ |
| (2) ව්‍යාපාරයේ භාවිතය සඳහා මෝටර්රථයක් ණයට මිලදී ගැනීම | ................................ | ................................ |

33. පහත සඳහන් ගනුදෙනු තුළින් ව්‍යාපාරයේ බැංකු ශේෂය **වැඩි වේ ද අඩු වේ ද** යන්න සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය** |
|---|---|
| (1) ණයගැතියෙකු විසින් ව්‍යාපාරයේ බැංකුවේ ඇති ජංගම ගිණුමට චෙක්පතක් තැන්පත් කිරීම | ........................... |
| (2) බැංකුව විසින් චෙක්පොත් ගාස්තු අය කිරීම | ........................... |
| (3) ව්‍යාපාරයේ විදුලිබිල චෙක්පතකින් ගෙවීම | ........................... |
| (4) බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වීම | ........................... |

**34.** ව්‍යාපාරයක රු. 13 000ක ගැනුම් ඉන්වොයිසියක්, ගැනුම් ජර්නලයේ රු. 31 000 ලෙස වාර්තා කොට එහි පොදු ලෙජරයට ද පිටපත් කොට ඇත.

(අ) ඉහත වරද නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

.......................................................................................................................

.......................................................................................................................

(ආ) මෙම වරද නිසා ලාභයට ඇතිවන බලපෑම කොපමණ දැයි තීරණය කර එය වැඩි වීමක් ද අඩු වීමක් ද වෙනස් නොවීමක් ද යන්න සඳහන් කරන්න.

**35.** සමාගමක දැකිය හැකි සංචිත දෙකක් නම් කරන්න.

(1) .......................................................................................................................

(2) .......................................................................................................................

**36.** ව්‍යාපාරයක් එක්තරා ගිණුම් වර්ෂයක් තුළ මිලට ගත් තොගයක් සම්බන්ධ තොරතුරු පහත වේ.

| | රු. '000 |
|---|---|
| ලැයිස්තුගත මිල (රු. 6 000 බැගින් ඒකක 1 000) | 6 000 |
| වෙළෙඳ වට්ටම් | 300 |
| ගෙන ඒමේ කුලී | 100 |
| බෙදාහැරීමේ වියදම් | 600 |
| වර්ෂය අග ඉතිරි තොගය ඒකක 100කි. | |

වර්ෂය අවසාන තොගයේ පිරිවැය කොපමණ ද?

.......................................................................................................................

**37.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ.

| | රු. '000 |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 500 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 800 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 1 100 |
| අමුද්‍රව්‍ය තොගයේ අඩු වීම | 200 |
| ප්‍රාථමික පිරිවැයට ගණනය කළ නොනිමි තොගයේ වැඩි වීම | 150 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) ප්‍රාථමික පිරිවැය (රු.)

.......................................................................................................................

(ii) මුළු නිෂ්පාදන පිරිවැය (රු.)

.......................................................................................................................

**38.** ව්‍යාපාරයක 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ණයගැතියන් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

| | රු. |
|---|---|
| 2013.04.01 දිනට ණයගැති ශේෂය | 120 000 |
| 2014.03.31 දිනට ණයගැති ශේෂය | 180 000 |
| වර්ෂය තුළ බොල්ණය කපා හැරීම් | 4 800 |
| කපාහළ බොල්ණය ආපසු ලැබීම | 6 000 |

සෑම වර්ෂයකම අවසාන ණයගැතියන්ගේ ශේෂය මත 4% ක් අඩමාණ ණය ලෙස වෙන් කෙරේ.

(i) 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා ලද බොල්ණය සහ අඩමාන ණය වටිනාකම කොපමණ ද?

.......................................................................................................................

(ii) 2014.03.31 දිනට ණයගැති ශුද්ධ වටිනාකමෙහි අඩු වීම හෝ වැඩි වීම කොපමණ ද ?

.......................................................................................................................

**39.** සමානව ලාභාලාභ බෙදා ගනිමින් නිම්මි සහ සඳුන් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙනයන ලදී. 2013.04.01 දින රුවනි ද හවුල්කරුවකු ලෙස බැඳුණි. එදින සිට නිම්මි, සඳුන් සහ රුවනි 3 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමට එකඟ විය. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ගැළපූ පසුව රුවනිගේ ප්‍රාග්ධනය රු. 50 000කින් අඩු වූ අතර, සඳුන්ගේ ප්‍රාග්ධනය රු. 50 000කින් වැඩි විය.

2013.04.01 දිනට කීර්තිනාමය කොපමණ ද ?

.......................................................................................................................

**40.** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ ගිණුම්කරණයට අදාළ වන විධිවිධාන කිහිපයක් පහත දී ඇත.
A - ලාභාලාභ සමානව බෙදා ගත යුතු වේ.
B - ප්‍රාග්ධනයට පොළී හිමි නොවේ.
C - හවුල්කරුවෙකු විශ්‍රාම ගැනීම හෝ මියගිය විට ඔහුගේ / ඇයගේ හිමිකම ණය ගිණුමකට මාරු කලවිට ඒ වෙනුවෙන් වාර්ෂිකව 5%ක පොළියක් ලබා දිය යුතු වේ.
D - ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් සපයා ඇති ණය මුදල් වෙනුවෙන් 5% ක පොළියක් හිමි වේ.

ඉහත තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | අදාළ විධිවිධාන / විධිවිධානය (අක්ෂර පමණක් දක්වන්න) |
|---|---|
| (i) හවුල් ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජනය කිරීම | .................... |
| (ii) 24 වෙනි වගන්තිය | .................... |
| (iii) 42 වෙනි වගන්තිය | .................... |

**41.** ව්‍යාපාරයක තොග ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳව පහත තොරතුරු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| 2014.01.01 - | ශේෂය | - ඒකකයක් රු. 500 බැගින් ඒකක 100 |
| 2014.01.15 - | තොග ලැබීම් | - ඒකකයක් රු. 550 බැගින් ඒකක 400 |
| 2014.01.30 - | විකිණීම සඳහා තොග නිකුත් කිරීම් | - ඒකක 300 |

(i) මාසයේ විකිණීමට තිබූ තොගයේ වටිනාකම කීය ද? ....................

(ii) විකිණීමෙන් පසු ජනවාරි 15 ගත් ඒකක වලින් ඉතිරි වීම වුනේ නම් අග තොගයේ වටිනාකම කීය ද?

....................

**42.** මූල්‍ය ප්‍රකාශනයක දැකිය හැකි සංරචක 4 ක් නම් කරන්න.

(1) .................... (3) ....................

(2) .................... (4) ....................

**43.** 2014.03.31 දිනෙන් අවසන් වසර සඳහා සීමිත මිනුර පොදු සමාගමට අදාළව පහත තොරතුරු දී ඇත.

| | රු. '000 |
|---|---|
| කාලච්ඡේදයේ ලාභය | 5 200 |
| මෝටර් රථයක් විකිණීමේ ලාභය | 200 |
| ආදායම් බදු ගෙවීම | 300 |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂය | 100 |
| තොගයේ වැඩි වීම | 20 |
| වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම | 360 |

ගෙවිය යුතු බදු වල වටිනාකම කීය ද? ....................

● **ප්‍රශ්න අංක 44 සහ 45 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

**44.** සීමිත දර්ශා පොදු සමාගමේ 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ උද්ධෘතයක් පහත දී ඇත.

(රු. '000)

| විස්තරය | සාමාන්‍ය කොටස් | නිදහස් කළ නොහැකි වරණීය කොටස් | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් |
|---|---|---|---|---|---|
| ශේෂය | 2 500 | 1 000 | - | 500 | 600 |
| A | - | - | 500 | - | (500) |
| B | 500 | - | (300) | - | (200) |
| C | 500 | - | - | - | - |
| D | - | - | - | 300 | 500 |

ඉහත A, B, C සහ D වලින් දක්වා ඇති තොරතුරු සඳහන් කරන්න.

(1) A :- ....................
(2) B :- ....................
(3) C :- ....................
(4) D :- ....................

45. පහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණය යටතේ සටහන් කර දක්වන්න.

1. වර්ෂයේ අධි අඩමාන ණය වෙන් කිරීම් රු. 1 000
2. රු. 25 000ක අතුරු ලාභාංශ ගෙවීම්
3. පොදු සංචිතයට රු. 50 000ක් මාරු කිරීම
4. රු. 60 000ක ප්‍රසාද කොටස් නිකුත් කිරීම

| | වත්කම් | = | වගකීම් | + | ප්‍රාග්ධන |
|---|---|---|---|---|---|
| (i) | .................... | | .................... | | .................... |
| (ii) | .................... | | .................... | | .................... |
| (ii) | .................... | | .................... | | .................... |
| (iv) | .................... | | .................... | | .................... |
| (v) | .................... | | .................... | | .................... |

46. පහත ගනුදෙනු වලට අදාල මූලික ලියවිලි නම් කරන්න.

| ගනුදෙනුව | ලියවිල්ල |
|---|---|
| 1. ඉඩම් ප්‍රත්‍යාගණන ලාභ රු. 50 000 වාර්තා කිරීම | .............................. |
| 2. ගෙවූ අතුරු ලාභාංශ රු. 80 000 | .............................. |
| 3. පොදු සංචිතයට රු. 20 000ක් මාරු කිරීම | .............................. |
| 4. සේවක වන්දි වෙනුවෙන් රු. 100 000 ක් වෙන් කිරීම | .............................. |

47. වර්ෂයේ ඉඩම් ප්‍රත්‍යාගණන කිරීම් අලාභය රු. 200 000 කි. එම ඉඩම් පෙර වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු. 150 000 ක් ලාභයක් ප්‍රත්‍යාගණන සංචිත ගිනුමට වාර්තා කර ඇත. ජ්නල් සටහන දක්වන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

48. 2010-04-01 පිරිවැය රු 500 000ක් වූ සමුච්චිත ක්ෂය රු. 120 000ක් වූ උපකරණයක් රු. 100 000ක් යොදා වැඩි දියුණු කරන ලදි. එමගින් එහි ජීව කාලය වර්ෂ 10 සිට 12 දක්වා වැඩි විය. සුන් බුන් අගයද රු. 100 000 සිට රු. 40 000 දක්වා අඩු විය 2010-12-31 න් අවසන් වර්ෂයට උපකරණ වාර්ෂික ක්ෂය ප්‍රමාණය කොපමණද?

..............................................................................................................................

..............................................................................................................................

49. 2010-04-01 පිරිවැය රු. 150 000ක්වූ සමුච්චිත ක්ෂය රු. 120 000ක් වූ එදින යල් පැන ගිය යන්ත්‍රයක් 2011-01-01 රු. 40 000කට විකුණන ලදි. යන්ත්‍ර සරල වර්ග ක්‍රමයට 20% ක්ෂය කරයි.

යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය කීයද? ............................................

50. 2010-12-31න් අවසන් වර්ෂයේ තොගයේ පිරිවැය රු. 500 000 එය නිවැරදිව ගලපා ඇත. එදින එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 600 000 කි. එම වර්ෂයේ ගිණුම් සකස් කරන කාලයේදී එම මුලු තොගයම රු. 580 000ක විකුණා ඇති අතර එහිදි රු. 100 000 ක විකුණුම් වියදමක් දරා ඇත. ඉහත ගලපා නැති ගනුදෙනු සම්බන්ධ ජ්නල සටහන දක්වන්න.

..............................................................................................................................

..............................................................................................................................

28/02/2016

| කාලය විනාඩි : පැය 03 යි | II කොටස | ගිණුම්කරණය |
|---|---|---|
| | | Grade-13 |

Learning Resource Center
De Mazenod College
Kandana

- පළමු වන ප්‍රශ්ණය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

**01.** 2015/03/31 දිනට සේකර පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර රු මිලියන | හර රු මිලියන |
|---|---|---|
| වියදම් | 160 | |
| ගෙවූ ආදායම් බදු | 50 | |
| විකුණුම් | | 3610 |
| දේපළ පිරියත උපකරණ (පිරිවැය 2014-04-01) | 2 250 | |
| 2014/04/01 දින දේපල පිරියත උපකරණ ක්ෂය වෙන් කිරීම | | 400 |
| ගැණුම් | 1020 | |
| ණයගැතියෝ | 130 | |
| 2014-04-01 අඩමාණ ණය වෙන් කිරීම | | 20 |
| ණයහිමියෝ (වෙළඳ ගෙවිය යුතු දෑ) | | 60 |
| ලද වට්ටම් | | 10 |
| ගෙවූ ලාභාංශ | 100 | |
| තොගය (පිරිවැය 2014-04-01) | 50 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටස් මිලියන 20) | | 700 |
| 2014/04/01 රඳවා ගත් ඉපයුම | | 600 |
| ගෙවූ කල්බදු වාරිකය | 300 | |
| සේවක වැටුප් | 1000 | |
| මුදල් | 770 | |
| 2015-03-31 දින වර්ෂ 2කට තැන්පත් කල ස්ථාවර තැන්පතු | 1170 | |
| 20% බැංකු ණය (2014/10/01 ගත්) | | 100 |
| හිමිකම් නිකුත් කිරීමේ ගිණුම | | 800 |
| ගෙවිය යුතු සේවක E.P.F | | 100 |
| කල්බදු ණය හිමියෝ | | 600 |
| | 7 000 | 7 000 |

1. ශේෂ පිරික්සුමේ දී ඇති වියදම පහත අයිතම වලින් සමන්විත වේ.

| | රු මිලියන |
|---|---|
| විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 50 |
| පරිපාලන පිරිවැය | 100 |
| මූල්‍ය පිරිවැය | 10 |
| | 160 |

2. බැංකු ණය පොළිය උපචිතව පවතී. පිරිවැය මිලියන 70කි. ශුද්ධ උපලබ්ධි අගය මිලියන 60 කි.

3. 2015/03/31 දිනට තොගයේ පිරිවැය මිලියන 70කි. ශුද්ධ උපලබ්ද්ධි අගය රු මිලියන 60 කි.

4. ගිණුම් කාලච්ඡේදයේ ආදායම් බදු වියදම ලෙස රු මිලියන 80 ක් ඇස්තමේන්තු කරන ලදි.

5. ණයගැතියන් ආපසු එවන ලද රු මිලියන 10 ක බැර පතක් පොත් වලින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුනි.

6. 2015/04/02 දින මූල්‍ය වාර්ථා අනුමත කිරීමට පෙර 2015/03/31 එදින සිට රු මිලියන 20 ක ණයගැතියකු බුන්වත් වූ බව උසාවියක් ප්‍රකාශ කල අතර ඉතිරි ණයගැතියන්ගේ 10% අඩමාණ ණය වෙන් කල යුතුයි.

7. 2014/04/01 දින සිට භාණ්ඩ අලෙවි කිරීම මාස 6 ක වගකීම් සහිත වීමක් යටතේ සිදු කරන අතර ඒ සඳහා රු මිලියන 30 ක වගකීම් සහතික වෙන් කිරීමක් පවත්වාගත යුතු බව කළමණාකරුවන් යෝජනා කර ඇත.

8. **අමතර කරුණු**

2015-03-31 දිනට දේපල පිරියත පහත පරිදි සකස් වී ඇත.

| | **2014-03-31 පිරිවැය රු. මිලියන** | **2014-03-31 සමුච්චිත ක්ෂය රු. මිලියන** | **ජීව කාලය** |
|---|---|---|---|
| ඉඩම් (සාධාරණ අගය) | 500 | - | - |
| ගොඩනැගිලි | 1 000 | 300 | 10 |
| කාර්යාලය උපකරණ | 150 | 100 | 3 |
| 2014-04-01 ගත් කල්බදු රථය | 600 | - | ? |
| | 2 250 | 400 | |

9. ප්‍රවර්ධන වර්ෂයට ක්ෂය කල හැකි දේපල ක්ෂය කර නොමැත. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කල යුතුය.

2014-04-01 මූල්‍ය කල්බදු ක්‍රමයට රථයක් ගෙන ඇත. එහි ජීව කාලය වර්ෂය 5කි. කල්බදු කාලය වර්ෂ 3කි. කල්බදු කාලය අවසානයේ රථයේ අයිතිය ගැණුම්කරුට මාරු නොවේ. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි. වාර්ෂික කල්බදු වාරික මිලියන රු 300 කි. ප්‍රථම වාරිකය 2015-03-31 දින ගෙවා ඇති අතර එය කල්බදු වාරික ගිණුමට හර කර ඇත. කල්බදු දේපල වල සාධාරණ අගය පොත් වල වාර්ථා කර ඇත. කල්බදු වාරිකය තුල ඇතුලත් පොළිය පහත දක්වේ.

| **වසර** | **පොලිය (මිලියන)** |
|---|---|
| 2014 / 2015 | 150 |
| 2015/ 2016 | 100 |
| 2016 / 2017 | 50 |

10. 2014/04/01 තිබූ සෑම සාමාන්‍යය කොටස් 5 : 3 බැගින් කොටස් රු 50 බැගින් ප්‍රසාද නිකුතුවක් සිදු කරන ලද මේ සඳහා රඳවාගත් ඉපයුමේ ගිණුම ශේෂය භාවිතා කරන මේ සම්බන්ධයෙන් පොත් වල කිසිදු සටහනක් තබා නැත.

11. 2015/03/31 දින තිබූ සෑම සාමාන්‍යය කොටස් 2 : 1 බැගින් හිමිකම් නිකුතුවක් කොටසක් රු 50 බැගින් සිදු කළ අතර හිමිකම් නිකුතුවේ කොටස් සියල්ල කොටස්කරුවන් විසින් මිලදී ගන්නා ලදි. එම එකතු කරගත් මුදල හිමිකම් නිකුත් කිරීමේ ගිණුමට බැර කරන ලදි.

12. ගොඩනැගිලිල් රු මිලියන 900කටද ප්‍රථම වර්ෂ 2015-03-31 දින ප්‍රත්‍යාගණනය කර ඇත.

13. සේවක අර්ථ සාධක අරමුදල් සමාගමේ දායකය පිළිවෙලින් (E.P.F) හා (E.T.F) 15% හා 3% වේ. වර්ෂයට අදාල සමාගමේ දායකයන් ගලපා නැත.

**<u>අවශයය වන්නේ,</u>**

1. ප්‍රසිද්ධ කිරීමේ සුදුසු ආකෘතියකට විස්තීර්ණ අදායම් ප්‍රකාශය (සටහන් සහිතව)
2. හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
3. මූල්‍ය තත්ව ප්‍රකාශය 2015-03-31 ට (සටහන් සහිතව)

13 ශ්‍රේණිය
ගිණුම්කරණය

**02.** සංජු හා මංජු උපදේශණ සේවා ආයතනයක් ලෙස පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2015-03-31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම් තොරතුරු පහත දැක්වේ.

| | | හර | බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් (2014-04-01 දිනට) | සංජු | | 150 000 |
| | මංජු | | 100 000 |
| ජංගම ගිණුම් (2014-04-01 දිනට) | සංජු | | 20 000 |
| | මංජු | 10 000 | |
| ලද සේවා ආදායම් | | | 420 000 |
| ලිපි ද්‍රව්‍ය වියදම | | 30 000 | |
| ප්‍රචාරණ ගාස්තු | | 20 000 | |
| විදුලි ගාස්තු | | 15 000 | |
| රක්ෂණ ගාස්තු | | 25 000 | |
| ස්ථාවර තැන්පතුව | | 200 000 | |
| කාර්යාල උපකරණ (පිරිවැයට) | | 150 000 | |
| 2014-04-01 උපකරණ ක්ෂය වෙන් කිරීම | | | 30 000 |
| හවුල් කරුවන්ගේ ගැනිලි | සංජු | 50 000 | |
| | මංජු | 70 000 | |
| සංජුගේ ණය ගිණුම | | | 100 000 |
| සංජුට ගෙවූ ණය පොලිය | | 3 000 | |
| හවුල්කරුවන්ට ගෙවූ වේතන | සංජුට | 30 000 | |
| | මංජුට | 20 000 | |
| සේවක වේතන | | 15 000 | |
| මුදල් හා බැංකු ශේෂය | | 202 000 | |
| ලද තැන්පත් පොලිය | | | 20 000 |
| | | 840 000 | 840 000 |

**අමතර තොරතුරු.**

1. ඉදිරියට ලැබී ඇති උපදේශණ සේවා ආදායම් රු 20 000 කි.
2. ස්ථාවර තැන්පතුව සඳහා වර්ෂයට අදාළ පොලී ආදායම් රු 25 000 කි. එය තවම ලැබී නැත.
3. කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂය වීම රු 15 000 කි.
4. සංජුට අයත් ගොඩනැගිල්ලක හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන අතර ඒ සඳහා වාර්ෂික කුලිය රු 50 000 කි. තවම ගෙවා නැත.
5. මංජුගේ පෞද්ගලික ජීවිත රක්ෂණ වාරිකය රු 10 000 හවුල් ව්‍යාපාරයෙන් ගෙවා ඇති අතර එය මුදල් පොත බැර කර රක්ෂණ ගාස්තු ගිණුම හර කර ඇත.
6. සංජු විසින් හවුල් ව්‍යාපාරයේ වාර්ෂික වරිපනම් ගාස්තුව රු 5 000 සිය පෞද්ගලික මුදලින් ගෙවා ඇති අතර ඒ පිළිබඳ පොත් වල සටහනක් තබා නොමැත.
7. හවුල් ගිවිසුමේ කොන්දේසි පහත දැක්වේ.
   i) ප්‍රාග්ධන සඳහා 10% පොලියක් හිමිවේ.
   ii) සංජුට රු 36 000 ක හා මංජුට රු 24 000 ක වාර්ෂික වේතනයක් හිමි වේ.
   iii) සංජුට හා මංජුට ලාභඅලාභ පිළිවෙලින් රු 3 : 2 අනුපාතයට බෙදා ගනී.
8. 2015-03-31 තිලක් නව හවුල්කරුවකු වශයෙන් හවුල් ව්‍යාපාරයට බඳවා ගත් අතර ඔහු ප්‍රාග්ධන දායකය වෙනුවෙන් රු 120 000 ක මුදලක් රැගෙන එන ලදි. එය තවම පොත් වල වාර්තා කර නැත. එදිරියට සංජු මංජු තිලක් පිළිවෙලින් 5 : 3 : 2 අනුපාතයට ලාභ බෙදා ගන්නා අතර එදින කීර්තිනාමය තක්සේරුව රු 100 000 කි. එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධණ ගිණුමෙන් ගළපා ගත යුතුය.

අවශ්‍යය වන්නේ,

1. 2015-03-31 න් අවසන් වර්ෂය සඳහා සංජු මංජු හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය (ලාභ විසර්ජනයද ඇතුළත්ය.)
2. සංජු හා මංජුගේ ජංගම ගිණුම්.
3. සංජු මංජු හා තිලක් හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්.
4. සංජු මංජු හා තිලක් හවුල් ව්‍යාපාරයේ 2015-03-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

---

**03.** අතුල ආයතනයේ 2013-03-31 දිනට ශේෂ පත්‍රය තොරතුරු පහත දක්වේ.

| | 000 |
|---|---|
| දේපල පිරියත උපකරණ (පිරිවැය 1000) | 800 |
| අයෝජනය | 100 |
| තොගය | 400 |
| මුදල් | 200 |
| | 1 500 |
| හිමිකම් | 1 000 |
| දිගුකාලීන ණය | 300 |
| ණය හිමියෝ | 200 |
| | 1 500 |

පහත ගනුදෙනු අප්‍රේල් මාසයට අදාළ වේ.

1. දේපල පිරියත උපකරණ, වාර්ෂිකව පිරිවැය මත 24% ක්ෂය කරයි.
2. මාසයේ ණයට ගැණුම් (තොග) රු 600 000 කි.
3. මාසයේ වියදම් රු 100 000 කි. එය මුදලින් ගෙවා ඇත.
4. මාසයට අදාළ ආයෝජන ආදායම් ලැබීම රු 20 000 කි.
5. සියළු භාණ්ඩ අත්පිට විකුණුම් අතර මාසයේ මුළු විකුණුම් ආදායම් රු 900 000කි. විකුණුම් පිරිවැය 700 000 කි.
6. මාසය තුල අයිතිකරු මුදලින් කළ ගැනිලි රු 80 000 කි. භාණ්ඩ ගැනිලි රු 20 000 කි.
7. ණය හිමියන්ට මුදල් ගෙවීම් රු 500 000 කි. ලද වට්ටම් රු 15 000 කි.
8. ආපසු යැවුම් රු 25 000 කි.
9. දිගු කාලීන ණය වාරික ගෙවීම් රු 100 000 කි. එහි ඇතුලත් පොලී වියදම රු 30 000 කි.
10. අප්‍රේල් 30 ඉතිරි තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු 250 000 කි.

**අවශ්‍ය වන්නේ,**

ඉහත ගනුදෙනු පහත සමීකරණය යටතේ ආරම්භ ශේෂයන් සමඟ වාර්තා කිරීම

01. දේපල පිරියත + අයෝජන + තොගය + මුදල් = හිමිකම් + ණය හිමි + දිගු කාලීන ණය
02. අප්‍රියෙල් මාසය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

---

**04.** (අ) සීමිත පැරකුම් සමාගමේ 2015 පෙබරවාරි මාසයේ බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය රු 140 000 කි. 2015-02-28 දින තැම්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් වල වටිනාකම රු 20 000 ක් වූ අතර ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු 10 000 ක් විය.

2015-03-31 දින සමාගමේ ප්‍රධාන ගෙබඩාගිල්ලේ ඇති වූ ගින්නක් නිසා සියළු ගිණුම් පොත්පත් හා පරිගණක පද්ධති විනාශ විය.

2015 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | | |
|---|---|---|
| 1 | මුදල් තැම්පතු | 70 000 |
| 2 | චෙක් තැම්පතු | 80 000 |

| | | |
|---|---|---|
| 3 | චෙක් සඳහා ගෙවීම් | 60 000 |
| 4 | බැංකු ගාස්තු | 2 000 |
| 5 | ණය ගැතියන්ගෙන් ලද සෘජු ප්‍රේෂණ | 10 000 |

2015-03-31 දින තැම්පත් කළ රු 30 000 ක චෙක්පතක් පමණක් එදිනට නිශ්කාශනය නොවී පැවතුණු බව බැංකුවෙන් කරනු ලැබූ විමසීමකදී අනාවරණය විය.

චෙක්පොතේ පිළිපත් පිරික්සීමේදී මාර්තු මාසය තුළදී නිකුත් කළ චෙක්පත් වල වටිනාකම රු 100 000 ක් බව හෙළි විය. පෙර මාසයේ ඉදිරිපත් නොවූ චෙක්පත් බැංකුවට ඉදිරිපත් වී තිබුණි.

**අවශ්‍ය වන්නේ,**

1. මුදල් පොතේ (බැංකු තීරුවේ ආරම්භක ශේෂය 2015-03-01 දිනට)
2. 2015-03-31 දිනට ශේෂ පත්‍රයේ නිරූපණය කළ යුතු බැංකු ශේෂය
3. 2015 මාර්තු 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම
4. 2015 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

4 (ආ) පහත තොරතුරු තරංග පොදු සමාගමේ දේපල පිරියත උපකරණ වලට අදාළ වේ.

| **අයිතමය** | **2014-04-01 දිනට** 000 | **2014-04-01 දිනට සමුච්චිත ක්ෂය** 000 |
|---|---|---|
| ඉඩම් (සාධාරණ අගය) | 5 000 | - |
| ගොඩනැගිලි (පිරිවැය) | 4 000 | 1 600 |
| උපකරණ (පිරිවැය) | 1 000 | 400 |
| රථ (පිරිවැය) | 3 000 | 1 200 |

**අතිරේක තොරතුරු**

01. 2014-04-01 රු 350 000 ක උපකරණයක් අත්පත් කර ගන්නා ලදි. එය රු 50 000 ක වියදමක් දරා 2015-06-30 සවිකර නිම කරන ලදි. එදින සිට උපකරණය භාවිතා කරන ලදි උපකරණ පිරිවැය මත 10% ක්ෂය කරයි.
02. ඉඩම 2015-08-01 රු 6 000 000 කට නැවත ප්‍රත්‍යාගණනය කරන ලදි. පෙර වර්ෂයේ ප්‍රත්‍යාගණනයෙන් රු 200 000 ක අලාභයක් වාර්තා කර ඇත.
03. ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට 5% ක්ෂය වන අතර 2013-03-31 දින ගොඩනැගිලි 3 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.
04. 2014-04-01 දින පිරිවැය රු 1 000 000 ක් වූ සමුච්චිත ක්ෂය රු 800 000 ක් වූ රථයක් රු 500 000 කට පවරා රු 1 200 000 ක් වටිනා නව රථයක් අත්පත් කර ගන්නා ලදි. වෙනස මුදලින් ගෙවන ලදි සියළු රථ හීන වන ක්‍රමයට 20% ක්ෂය කරයි.

**අවශ්‍ය වන්නේ,**

01. L.K.A.S 16 ට අනුව ශේෂ පත්‍රයේ සටහනක් ලෙස ඇතුලත් කිරීමට දේපල පිරියත උපකරණ ලේඛණය
02. ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ගැලපීමේ ජ'නල සටහන් වෙන වෙනම දක්වන්න.
03. රථ පැවරිය ලාභය හෝ අලාභය

05. පරිසරයේ සුරකීමේ අරමුණින් ගමක තරුණ කොටස් එකතු වී පවත්වාගෙන යන "අරුණ" සමාජයේ පොත් වලින් උපුටා ගත් තොරතුරු පහත දක්වේ.

---

**05.** (අ) සංගමයේ වත්කම් හා වගකීම්

| | **2015-12-31** **රු 000** | **2014-12-31** **රු 000** |
|---|---|---|
| හිඟහිටි සාමාජික මුදල් | 600 | 800 |
| කලින් ලද සමාජික මුදල් | 400 | 200 |
| උපකරණ (ධාරණ අගය) | 6 000 | 5 000 |
| බැංකු ඇති මුදල් | ? | 250 |

02 2015-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ගෙවූ වියදම් (000)

| | |
|---|---|
| නිරීක්ෂණ චාරිකා සඳහා | 800 |
| පැල තවාන වියදම් | 200 |
| උපදේශණ ගාස්තු වියදම් | 300 |
| සාමාජික ආහාර පාන වියදම් | 400 |

03 වර්ෂ මුල පිරිවැය 150 000 ක් වටිනා උපකරණ කට්ටලයක් පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග වශයෙන් ලද අතර එය කාලච්ඡේද දෙකක් තුල සමාන ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

04 2015-03-31 දිනට සංගමයේ සාමාජික ගණන 60 කි. එක් අයෙකුගේ සාමාජික ගාස්තුව රු 20 000 කි.

05 පෞද්ගලික බැංකුවකින් පැල තවාන ව්‍යාපෘතිය ආධාර පිණිස රු 500 000 ක මුදලක් පරිත්‍යාග කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

01. සමිතියේ 2015-03-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

5. (ආ) සාලිය ව්‍යාපාරයේ 2015 පෙබරවාරි මාසයට අදාල ණය ගැතියන් හා ණය හිමියන්ට අදාළ තොරතුරු පහත දක්වේ.

(i) ණය ගැතියන්ට අදාළ තොරතුරු

| ණය ගැතියෝ | ණයට විකුණුම් | ආපසු වවුම් | මුදල් වට්ටම් අඩු කල පසු මුදල් ලැබීම් | දුන් මුදල් වට්ටම් |
|---|---|---|---|---|
| අරුණ | 20 000 | 2 000 | 18 000 | 10% |
| කපිල | 30 000 | 3 000 | 9 000 | 10% |

(ii) ණය හිමියන්ට අදාළ තොරතුරු

| ණය හිමියෝ | ණයට ගැණුම් | ආපසු යැවුම් | මුදල් වට්ටම් අඩු කල පසු මුදල් ගෙවීම් | ලද මුදල් වට්ටම් |
|---|---|---|---|---|
| සමන් | 30 000 | 4 000 | 38 000 | 5% |
| කුමාර | 40 000 | 2 000 | 28 500 | 5% |

(iii) 2015-02-01 දිනට ණයගැති හා ණය හිමි ශේෂ

| ණය ගැතියෝ | | ණය හිමියෝ | |
|---|---|---|---|
| අරුණ | 10 000 | සමන් | 15 000 |
| කපිල | 20 000 | කුමාර | 5 000 |

(iv) අරුණ විකුණුම් රු 3 000 ක ඉන්වොයිසියක් ඉහත තොරතුරු වාර්තා කිරීමේදී පොත් වලින් සම්පූර්ණයෙන් අත්හැරීම් තිබී ඇත.

**අවශ්‍ය වන්නේ,**

01. පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුම
02. ණය හිමි ලෙජරයේ ශේෂ ලැයිස්තුව

**06.** සීමිත අතුල සමාගමේ 2011 මාර්තු මාසයේ ණයට ගැනුම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිනය | ණය හිමියා | ගැනුම් | ආපසු යැවුම් | පියවීමේ තොරතුරු | |
|---|---|---|---|---|---|
| | | | | දිනය | වටිනාකම රු |
| 2015-03-4 | ජගත් | 600 000 | | 2015-03-12 | 570 000 |
| 2015-03-10 | කමල් | 1 000 000 (අඩු කල වෙළඳ වට්ටම් 10%) | | 2015-03-18 | 760 000 |
| 2015-03-15 | | | 100 000 | | |
| 2015-03-16 | රුවන් | 420 000 | | 2015-03-25 | 380 000 |
| 2015-03-20 | | | 20 000 | | |
| 2015-03-18 | තරංග | 500 000 | | 2015-03-25 | 300 000 |

**අතිරේක තොරතුරු**

01. විකුණූ දින සිට දින 10 ක් තුල සම්පූර්ණ මුදල ගෙවනු ලබන අවස්ථාවක 5% ක මුදල් වට්ටමක් ලබා ගත හැකිය.
02. ණය හිමියන්ට ගෙවීම කරනු ලබන්නේ චෙක්පත් මගින්ය.
03. ආංශික තුලන ක්‍රමයට යටතේ පොදු ලෙජරයේ පාලන ගිණුම් පවත්වාගෙන යනු ලබයි.
04. 2015-03-1 ණය හිමි ශේෂය 200 000 (බැර) වේ. 2011-03-2 එම මුළු මුදලට චෙක්පතක් නිකුත් කර ඇත. 5% මුදල් වට්ටමකට යටත්ව ගෙවා ඇත.
06. 2015-03-25 තරංගට නිකුත් කල චෙක් පත අගරු වී ඇති අතර ඒ සඳහා 2015-03-31 දින නව චෙක් පතක් නිකුත් කරන ලදි.

**අවශ්‍යවන්නේ,**

1. ඉහත ගනුදෙනු වලට අදාල
   - (i) ගැනුම් ජ'නලය
   - (ii) ආපසු යැවුම් ජ'නලය
   - (iii) ණය හිමි විශ්ලේෂණ තීරුව සහ වට්ටම් තීරු සහිත මුදල් පොතේ බැර පැත්ත
2. පොදු ලෙජරයේ පහත ගිණුම්
   - (i) ණය හිමි පාලන ගිණුම (ii) ආපසු යැවුම් ගිණුම
   - (iii) ලද වට්ටම් ගිණුම

**07.** (අ) මයුර ඇගලුම් ආයතනයට අදාල පෙබරවාරි මාසයට අදාලව පහත තොරතුරු සපයා ඇත.

| | රු 000 |
|---|---|
| නිෂ්පාදනයට තිබූ අමුද්‍රව්‍ය | 18 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 16 500 |
| සෘජු ශ්‍රමය | 8 000 |
| පුරස්කාර කුලිය (සෘජු) | 500 |
| කම්හල් වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 1 500 |
| කම්හල් වක්‍ර ශ්‍රම පිරිවැය | 2 000 |
| කම්හල් වක්‍ර වෙනත් වියදම් | 1 200 |
| යන්ත්‍ර ක්ෂය | 300 |
| ප්‍රචාරණ ගාස්තු | 400 |
| ණය පොලිය | 100 |
| කාර්යාල වියදම් | 600 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 200 |
| 2014-02-01 අමුද්‍රව්‍ය තොගය | 800 |
| 2014-02-28 අමුද්‍රව්‍ය තොගය | ? |
| අමුද්‍රව්‍ය ගැනුම් | ? |

**අවශ්‍යවන්නේ,**

1. පෙබරවාරි මාසය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛණය පිළියෙල කරන්න.

(ආ) ඉන්දික ව්‍යාපාරිකයාගේ පොත් වල 2015 වර්ෂය තුලදී පහත වැරදි සිදුවී ඇති බව සොයා ගන්නා ලදි.

01 කම්හල් සේවකයන්ට ගෙවූ වැටුප් රු 15 000 ක් පරිපාලන වේතන ගිණුමට හර කර ඇත.

02 අමු ද්‍රව්‍ය අවසාන තොගය රු 10 000 ක් අඩුවෙන් තක්සේරු කර ඇත

03 රු 20 000 ක අමුද්‍රව්‍ය ගැණුම් මූලික පොතේ පමණක් සටහන් කර ඇත.

04 ණය පොලිය රු 5 000 ක් ගෙවා හෝ වර්ථා කර නැත.

05 නිෂ්පාදනය සඳහා භාවිතා කල යන්ත්‍ර සඳහා වූ රු 12 000 ක වාර්ෂික ක්ෂය මග හැරී ඇත.

ඉහත එක් එක් සිද්ධිය නිසා ශුද්ධ ලාභයට හා නිෂ්පාදන පිරිවැයට සිදුවූ බලපෑම වැඩිවිය. අඩුවිය බලපෑමක් සිදු නොවීය. වශයෙන් සඳහන් කරන්න.
(පිළිතුරු ලිවීමේදී පහත ආකාරයෙන් වගුවක් භාවිත කරන්න.)

| සිද්ධිය | ශුද්ධ ලාභයට වූ බලපෑම | නිෂ්පාදන පිරිවැයට වූ බලපෑම |
|---|---|---|
| i | | |
| ii | | |
| iii | | |
| iv | | |
| v | | |